// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2034/36 - 2017 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2017.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/81(XII)

### 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 23 එ සහ 23 ඒ වගන්ති යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2017 අංක 1 දරන ජාතික පාරිසරික (ප්ලාස්ටික් අඩංගු කසළ සහ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම තහනම් කිරීම) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. කිසිදු තැනැත්තකු, ප්ලාස්ටික් අඩංගු කසළ හෝ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම, පිළිස්සීමට සැලැස්වීම, ඉඩ දීම හෝ අවසර දීම සිදු නොකළ යුතු ය.

3. ඉහත නියෝග වලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ වරදකට වරදකරු වන අතර 31 වැනි වගන්තිය යටතේ දඬුවමකට යටත් විය යුතු ය.

09-364

1A - PG 3679 — 5007 (2017/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*